# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 ඔක්තෝම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2018 ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 0.1%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 0.9%ක් ලෙස වාර්තා විය. ඔක්තෝම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -3.04%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.10%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 ඔක්තෝම්බර් මාසයේ 8.8% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 6.4%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.4%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 සැප්තැම්බර් මාසයේ 124.4ක් වූ දර්ශකාංකය 2018 ඔක්තෝම්බර් මාසයේ 124.9ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 ඔක්තෝම්බර් මාසයේ දර්ශකාංකය 0.5ක වැඩිවීමක් එනම් 0.4ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.03%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.42%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා අළුත් මාළු, බිත්තර, පොල්, පැපොල්, අර්තාපල්, කරවල, කුකුල් මස්, ලොකුළූණු, පොල්තෙල් සහ තිරිඟු පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් දෙහි, එළවළු, සහල්, සීනි, කෙසෙල්, පාන්(සාමාන්‍ය), කුරුඳු, අන්නාසි, අමු මිරිස්, සියඹලා, කොස් මදුළු හා කොස් ඇට සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 ඔක්තෝම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'විවිධ භාණ්ඩ හා සේවා', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ආපනශාලා සහ හෝටල්', සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා විය. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවිය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජුනි | 126.5 | 1.8 | 2.5 |
| | ජුලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |
| | ඔක්තෝම්බර් | 124.9 | 0.4 | 0.1 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව